ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **විදේශ විනිමය දෙපාර්තමේන්තුව** |
| දිනය | 2020 ජූලි 13 |

## විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම දිරිගැන්වීම සඳහා තවදුරටත් ගෙන ඇති ක්‍රියාමාර්ග

රට තුළ ව්‍යාප්ත වූ කොවිඩ් - 19 (Covid - 19) වසංගත තත්ත්වයේ බලපෑම්වලින් මිදීම සඳහා ක්‍රියාත්මක ජාතික ප්‍රයත්නයට සහාය ලබා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා රජය විසින් 2020.04.08 දින විශේෂ තැන්පතු ගිණුම හඳුන්වා දෙන ලදී. ඒ සඳහා යහපත් ප්‍රතිචාර ලැබෙමින් පවතින බව දැකිය හැකි අතර, මේ වන විට ආසන්න වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 87 ක මුදලක් විශේෂ තැන්පතු ගිණුම් සඳහා ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත.

ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විමසීමෙන් පසුව, විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම දිරිගැන්වීම සඳහා තවදුරටත් පහත දක්වා ඇති ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. **විශේෂ තැන්පතු ගිණුම්වලට අරමුදල් ලැබීමේ මූලාශ්‍ර පුළුල් කිරීම**

   අ. **2020.01.01 දින හෝ ඊට පසුව** විදේශයක සිට ශ්‍රී ලංකාවට පැමිණි ඕනෑම පුද්ගලයෙකුට ඔහු විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගන්නා ලද සහ ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ විනිමය භාවිත කර

i. රැගෙන එන ලද විදේශ විනිමය ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර් 15,000 හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් ඉක්මවා යන අවස්ථාවකදී, පැමිණෙන තොටුපොළෙහි දී ශ්‍රී ලංකා රේගුව වෙත **ප්‍රකාශයක්** ඉදිරිපත් කිරීමට

ii. රැගෙන එන ලද විදේශ විනිමය ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර් 15,000 හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයකට සමාන හෝ අඩු වන අවස්ථාවක දී, අදාළ බලයලත් වෙළෙන්දා වෙත **ප්‍රකාශයක්** ඉදිරිපත් කිරීමට

යටත්ව, ඕනෑම බලයලත් වෙළෙන්දෙකු සමග **2020.10.07 දින දක්වා** විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ හැකිය.

ආ. බලයලත් වෙළෙන්දා වෙත අරමුදල්වල මූලාශ්‍රය පිළිබඳව කරන ලද ප්‍රකාශයකට යටත්ව, තමා සන්තකයෙහි ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් **ඇ.එ.ජ. ඩොලර් 15,000 ක** සීමාවක් දක්වා සහ පවතින නියෝග සහ නියමයන්හි කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකුට 2020.10.07 දින දක්වා ඕනෑම බලයලත් වෙළෙන්දෙකු සමග විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ හැකිය.

ඇ. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකුට තමා සන්තකයෙහි රඳවා තබා ගත හැකි විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය 2020.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි ඇ.එ.ජ. ඩොලර් 10,000 සිට ඇ.එ.ජ. ඩොලර් 15,000 දක්වා වැඩි කර ඇත.

## 2. විශේෂ තැන්පතු ගිණුම් ඇපකර වශයෙන් ලබාදී ණය ලබා ගැනීම

විශේෂ තැන්පතු ගිණුම් හිමියන්ට තම තැන්පතුව ඇපකර වශයෙන් ලබා දී බලයලත් වෙළෙඳුන්ගෙන් පහත පරිදි ණය ලබාගත හැකිය.

අ. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් ශ්‍රී ලංකා රුපියල් වලින්

ආ. පවතින නියෝගවලට අනුව ණය ලබා ගැනීමට සුදුසුකම් ලත් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විශේෂ තැන්පතු ගිණුම් හිමියන්

ඉහත කරුණු සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු පහත පරිදි ලබාගත හැකිය.

අ. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි (www.dfe.lk) "බාගත කිරීම්" යටතේ දක්වා ඇති පහත සඳහන් නියෝග, නියම සහ විධානයන්ට ප්‍රවේශ වීම මගින්.

i. 2020.04.08 දිනැති අංක 2170/4 දරන රජයේ (අතිවිශේෂ) ගැසට් නිවේදනයෙහි පළ කර ඇති නියෝග

ii. 2020.07.01 දිනැති අංක 2182/32 දරන රජයේ (අතිවිශේෂ) ගැසට් නිවේදනයෙහි පළ කර ඇති නියෝග

iii. 2020.07.01 දිනැති අංක 2182/33 දරන රජයේ (අතිවිශේෂ) ගැසට් නිවේදනයෙහි පළ කර ඇති 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 8 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති නියමය

iv. බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කර ඇති 2020.07.06 දිනැති 2020 අංක 06 දරන විධාන

ආ. අධ්‍යක්ෂ, විදේශ විනිමය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01.

දුරකථන : +94 112 477 255, +94 112 477 244, +94 112 477 433

විද්‍යුත් තැපෑල : dfe@cbsl.lk

ඇ. ශ්‍රී ලංකාවේ ඕනෑම බලයලත් වෙළෙන්දෙකු මගින්.